# පන්හිඳ'ග
# ගෙත්තම්



ජේ. ප්‍රමිතා වෙත්තසිංහ

පන්හිඳ'ග ගෙත්තම්

ජායසුදේශී ප්‍රමිතා වෙත්තසිංහ

2023 - දෙසැම්බර්

# පිදුම

නිසදැස්වලට සහ මා හට ආදරය කරනා
සියලුම සහෘදයන්ට...

# ස්තූතිය!

මෙලොවට බිහි වූ දා පටන් මා පෝෂණය කළ මාගේ මුල් ගුරුවරුන් වන මාගේ අම්මාට සහ අප්පච්චීටත්, මාගේ සෙවණැල්ල බඳු අයියාට, මල්ලීට සහ අක්කාටත්,

පාසල් ගිය පළමු දා පටන් අකුරු කළ සියලු පාසල්වලටත්, මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයටත්,

සියලුම ගුරු මෑණිවරුන්ට සහ ගුරු පියවරුන්ටත්,

මෙම මහඟු අවස්ථාව අපට උදා කළ දුන් මහනුවර මහාමායා බාලිකා විදුහලේ ගරු විදුහල්පති තුමියටත්, ප්‍රාථමික අංශය භාර සහකාර විදුහල්පතිතුමියටත්, පොතක් ලියන්නට සිතක් පහල කළ සහෝදර ආචාර්ය මණ්ඩලයේ සමන්මලී ගුරුතුමියටත්,

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියේ නිර්මාතෘ වන සෙනෙවිරත්න මහලේකම් මහතාටත්,

ඡායාරූපවල මුල් හිමිකරුවන්ටත්,

මේ සඳහා මට නන් අයුරින් සහාය ලබා දුන් සියලු දෙනාටත්,

මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි


ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


2023 10 20

# හැඳින්වීම

ගලනා නදියක් බඳු ජීවිත ගමනේ විටෙක සතුටකුත් තවත් විටෙක දුකකුත් දැනුණු අවස්ථා මෙන් ම මාගේ ම නොවුණු එහෙත් මාගේ සිතට දැනුණු අවස්ථා අලළා මා පමණක් සිටින වට්ස්ඇප් සමූහයකට ලියවුණු කවි සිතුවිලිවලින් ස්වල්පයක්, ගුරුවරියක් ලෙස මා දැනට සේවය කරන මහනුවර මහාමායා බාලිකා විදුහලේ ක්‍රියාත්මක කෙරෙන "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හරහා ලෝකයට විවර කරමි.

1.

දරා දසමස් කුසේ රන්දා
සියක් දුක් විද සියක් ආයු මට
දුන්නේ අම්මේ ඔබ තමා
ඇවිදගන්නට හැකි කලත්,
සේම යන්නට බැරි කලත්
වැටුණු විට මට දුන්නු දෙඅතින්
එක් අතක් මේ ඔබෙ තමා...
මගේ දිවිමග සරු කරන්නට
මගේ ලොව තුළ සිහින දැකිමින්
මගේ ලෝකය ගොඩනගන්නට
මටත් පෙර වැයම් කරන්නේ
අප්පච්චී ඒ ඔබ තමා....
අපරිමිත ස්නේහෙ වඩමින්....!!!

2. පාට පාට දේදුන්නක

පාට අරන් ඉගිලී යන

පුංචි පුංචි සමනලුන් ඔබයි...

හෙමි හෙමිහිට පා තබමින්

පුංචි සිනා හඬ නගමින්

හෙට ලෝකය එලිය කරන

දීප්තිමත් හිරු කිරණ ද නුඹමයි...



3. මම හරි ආසයි

පොඩ්ඩක් නෙවෙයි මහ ගොඩක්

මීදුමෙන් වැහිච්ච නිස්කලංක

වැව රවුමේ හරි හිමීට ඇවිදින්න..

රොබරෝසියා මල් එක්ක හිනැහෙන්න

වැවේ රැළි ගැනෙන හඬ දෙසවනින්

විඳගන්න...

ඒත්, එහෙම ඇවිදින හැමදාම

අරගලයක්......

නොපෙනුනාට එළියට

හදවත ඇතුළේ දැවි දැවී පිච්චෙන

තෙරපෙන සිතුවිලි හිමින් මුදාලන්නට

අනේ මට අදත් හිතුණේ ම

තව දුර වුණා නම් වැව රවුම....💔

4. සමහර බැඳීම්වලට නමක් ඇත්තෙම නෑ

‘ඉස්සර වගේ බෑ දැන්..’

හදවතේ ගැඹුරුම තැනක

හරි හයියෙන් වැදිච්ච වදන් පෙළක්..

ඉස්සර වගේ දැන් අපිට,

හරි හයියෙන් හිනා වෙන්න බෑ

එක බත්පත බෙදන් කන්න බෑ

දහසකුත් දේවල් කතා කරන්නත් බෑ

ජීවිත දෙකක් නිසා මැද්දේ සීමාවක්…

මතක මැදින් ඇස් අදහා ගන්න නොහැකිව

මදකට සියල්ල නතර වුණේ,

ඒ බැඳීමට නමක් නැති නිසාම වෙන්නැති…

ලෞකික හා ලෝකෝත්තර ජීවිත අතර අතරමං වුණා මම

සත්තකින්ම…..

‘දවසක එන්නම් මෙහෙණින් වහන්සේ  බලලා යන්න..’

Hostel ජීවිතේ කියන්නෙම වෙනම Life එකක්. ගුරුවරියක් වෙන්න අඩිතාලම දැම්මේ විද්‍යාපීඨයෙන්.වසර දෙකක නේවාසික පුහුණුවක්.

"අවුරුදු දෙකක්.. මට නම් බෑ ගෙදරින් පිට ගිහින් නවතින්න.."

ඇත්තටම හිත හදාගන්න බැරි වුණත් නවතින්නම වුණා.

“අනේ අම්මා මාව දාලා යන්න එපා.."

"අනේ අප්පච්චී මාව දාලා යන්න එපා.."

ඒත් අම්මටයි අප්පච්චිටයි යන්නම වුණා.

ඉතින් ඊට පස්සේ හැමදේම තනියම කරගන්න වුණා.

**5.** අම්මෙ ඔබෙ සෙවණෙන්
මා මිදුණු දා පටන්
පැමිණි දුක් කම්කටොලු
තනිව මට විදගන්න
සිදු වෙලානේ තනි සිතින්...
අප්පච්චී ඔබෙ සෙවණෙන්
මා මිදුණු දා පටන්
මගෙ හයිය මම ම වී
ඉන්න සිදු වෙලා දැන්...
මහන්සි ද අමාරු ද
කියාවත් අසන්නට කෙනෙකු
නොමැති මේ අම්බලමෙ
කොදු පෙලේ පා දෙකේ
තනිව ගැවෙමි සිද්ධාලේප.....

ඉන්න බෑ කිය කිය ආව හොස්ටල් ජීවිතේ දාලා යන්න බෑ කියලා ඊට වඩා අඩන්න වෙයි කියලා පළවෙනි දවසේ සිතුණේ ම නෑ .

"ඔයා අඩන්න එපා.ඔන්න බලන්නකෝ අද මෙහෙම ඇඩුවට ඔයා අන්තිම දවසේ මෙහෙන් යන්න බෑ කියලා අඩයි."

හොස්ටල් ජීවිතේ හමුවුණු පළමුවෙනි ම යාලුවා.. එහෙම කිව්වා.

"අප්පෝ නෑ..මම නම් මෙහෙන් යන්නේ හරිම සතුටෙන්.ආය මේ පැත්තවත් බලන්නේ නෑ..." මම අඬ අඬා එහෙම කියද්දීත්, ඇය හිනා වුණේ දවසක ඇගේ කතාව ඇත්තක් වෙන හින්දාම වෙන්නැති.

**6.** ජීවිතේට,

ඔහ ගොඩක් දේවල් දුන්න

තවත් දේ හොදට කියලා දුන්න

පවුලකින් වෙන් ව විත්

තවත් පවුලක් හැදුන

නවාතැන්පල යි ඒ සොදුරු

මහවැලි මව්නි ඔබෙගේ තුරුල...

මතක පොතෙ පිටු අතර

දුවන සිත සනසාලන්න

වැටෙන කදුලැල් පිස දාලන්න

අපට කියලා දෙන්න...

ඇයි ද අද ඔබ ගොලු වෙලා

අම්මේ අපි යන්නෙ කෙලෙසද

වෙන් වෙලා...

7. සංසාර ගමනේ මේ නැවතුණු අම්බලමේ,
ආව ගිය ගොඩක් අය අතර
කලක් ළං වී උන්නු හුඟක් අය අද
එකඳු බොඳ ඡායාවකි,
හීනයක හෝ මුණ නොගැසෙනා...
එකෙක් දෙන්නෙක් ඉඳී,
යන්තමට තව හැඩහුරුව හිත් හී ඇඳී..
තවත් අතොරින් පතර ඔහෙ
විමසන්නේ,ඉන්නවාදැයි මළාදැයි
අතළොස්සකුත් තව එකෙක් දෙන්නෙක්
මඟ තොටේ දී හමු වෙලා
අසයි වතගොත පෙර ලෙසින් හිනැහිලා..
කලින් කල හමුවනා අලුත් උන් සමගිනා,
ජීවිතේ යයි තව දිර දිරා...
පෙර ලෙසින්මයි ඔවුන් සැමමත්
මැකී යයි දිනෙක බොඳ වෙලා..
දිනෙක යලි හමු වනු ඇතී අප..
මන්ද,
නිවන් මග තව දුර නිසා......

8. පාට පාට හීන ගොඩාරියක්

මව මවා ගෙවපු ජීවිතේ

හ්ම්ම්...

ඒ හීන,

එකින් එක එකින් එක හිමි හිමීට

ඇස් ඉස්සරහම

කඩාගෙන වැටෙද්දි,

ජීවිතේම කඩාගෙන වැටුණා....

ඒ විසිරුණු කැලි කැලි

ආයෙමත් එකින් එක එකතු කරන්

ජීවිතේ ගොඩනගා ගත්තාම

අර හීන ආයෙමත්

හිමි  හිමීට මැවි මැවී පෙනුණා....

දන්නවද ඒත්,

දැන් ඒ පාට පාට හීන

කලු පාටයි.......

9. ජීවිතේ විඳින්න..

හරි පුංචි දේවල්වලින්

සුළඟ වැස්ස සත්තු ගස් මල් සංගීතය එක්ක

හදවතට අමුතු ම රසයක් ගේනබව දැනෙද්දී

ගෙවෙන හැම තත්පරයක්ම

සතුටින් විතරක්ම පිරිලා තියෙයි...

ජීවිතේ කියන්නෙ

අරමුණු හඹායන එකම නෙවෙයි කියලා තේරෙද්දී,

ජීවිතේ අරුත වැටහේවී....

ජීවත් වෙන බව දැනේවී......♥

මේ පුංචි ශ්‍රී ලංකාවයි මාවයි දාලා පිටරට යන්න ගිය මගේ පන්තියේ චූටි දියණියන් ට.....

10. දුක දැනෙන්නේ,
අම්මට අප්පච්චිට විතරමද
ඇත්තටම....
ඇකයේ හොවාගෙන
හොඳ නරක කියා දෙන්නේ
අම්මලා අප්පච්චිලා විතරම ද
ඇත්තටම....
හැර දාලා දුරු රටක යන්න යන බව දැනී
කෙළි සිනා සතුටු මැද ගෙවෙන
සුන්දර මතක පොතෙ පිටුවලට
'සමාප්තයි' යන්න
ලියන්නට වෙන බවක්
දැනෙන මොහොතක් ගානේ
ඇස් තෙමෙන්නෙම අනේ
අම්මගේ අප්පච්චිගේ විතරම ද
ඇත්තටම...
නොවැදුවත් හැදූ
තමන්ගෙම දරුවෙකුගෙ
දුරස් වීමක් දැනෙන
ගුරු අම්මෙකුගේ ඇස්
තෙමෙන්නම බැරි ද
ඇත්තටම....





11. තුෂාරෙන් වැසීගිය කඳු අතර පතරින්

හීන් හිරු කිරණ චිත් වළාගැබ වහගද්දී,

කහපාට එළියෙන් වැවේ දිය දිළිසෙද්දී,

සීත සුළං රැළි යන්තමින් ගතෙහි දැවටෙද්දී,

රොබරෝසියා මල් එකින් එක හිමි හිමින්

ආදරෙන් පොළව සිඹගද්දී,

චමත්කාරය විඳින්න කියාපුම තැන

සෙමින් පියමනින බස් එකක

ජනේලය මුල්ල...

උදේට වැවරවුම කියන්නෙම,

තුරුණු සිත් ප්‍රේමයෙන් පුරවාලන

සොඳුරුතම තෝතැන්න.....♥

12. ජීවිතේ සමහර දේවල් තියනවා

පටන් ගත්ත තැනම නවතින

හිතට බරක් දැනෙන බැඳීම්

දුරස් වෙන එකමයි හොඳ..

කිරිල්ලියකගෙ අත්තටු කැපුවම

ඉගිල්ලෙන්නෙ බැරි වුණත්,

ඒ වේදනාවෙන් තැවෙනව හැමදාම...

ආයෙ කවදාවත් හිත හදාගන්න බැරි විදිහට

හිර වෙච්ච ජීවිතේකට කැමති නෑ කවුරුත්

ඉතිං නිදහසේ ඉන්න මම

කොහොම කැමති වෙන්නද....

13.

සීත මඳ නල හෙමි හෙමින් විත්,

ගතේ දැවටෙන පහස විඳිනට හැකි වේවි නම්...

එකිනෙකට පෙම් බඳින විලසින්

ගැටෙන විට තුරුපත් එකින් එක

නැගෙන සද්දෙට කන් දෙන්න හැකි නම්...

රාත්‍රී ගනදුරේ දිලෙන තරුකැට

එකට කැටි කොට රටා මවනට හැකිවේවි නම්...

භාවනාවක් වේවි එය,

සිත හදන සනහන....

වැටහේවී ඔබටම එය

ජීවිතේ ජීවත්වන බවම...❣



14. බිඳි බිඳී යන හීන අතරින්

කඳුලු මැද්දෙන් සිනා සෙන්නට

දිරිය දෙනු මැන දෙයියනේ මට

දෙකම්මුල් වියළීම යන්නට

බිඳුණු හදවත එකතු වන්නට

සිහිය නොනැසී පැවතගන්නට

දිගු හුස්ම රැලි යළි නොඑන්නට...

බිඳි බිඳී යන හීන අතරින්,

කඳුලු මැද්දෙන් සිනා සෙන්නට

දිරිය දෙනු මැන දෙයියනේ මට..!

නොබෝ දිනකින් මගේ කැදැල්ලෙන් පියඹා යන, ඉස් ඉස්සරෝම මා ගුරු මවක් කළ, මාගේ ගුරු දිවියේ පළමු ගෝල පිරිස වෙත හරි ආදරෙන්.....

**15.** පුරා දෙවසරක් දුන්නා ඔවා මිණී
මතු යම් දිනක යෙහෙනින්
බබළන්නට තරුවක් වී
දඬුවම් කළත් ඔබහට යහපතක් පතා
ඔබට වඩා මට රිදුණා ඒත් එදා
තබන පියවරක් පාසා ජය වේවා
කරන හැම දෙයක් පාසා සුබ වේවා
නොවැටුණු කිසිවෙකුත් නැති බව සිහි වේවා
දෙගුරුන් සිත් පිනා දිනයක වැජඹේවා
හෝඩියේ ගුරුතුමියගේ ආසිරි ඔබ සමඟින් ය සදා...
කන්න බොන්න කැසිකිළි පාසා යන්න
ඔබේ අතින් අල්ල ගත්තේ ආදරයෙන් මුසපත්ව
හැර දා යන්න යන බව සිහි වෙද්දී මට
නොහැකිය දරන්නට "මගෙ ආදර පුතේ" මට.....



16. ජීවිතේට...

සමහර දේවල් නොවුණා නම්,

සමහරු හමු නොවුණා නම්,

සමහරු එක්ක කතා නොකළා නම්,

සමහර තීරණ නොගත්තා නම්,

සමහර අදහස් නොදැරුවා නම්,

සමහර හීන පස්සේ නොගියා නම්,

ජීවිතේ...

මීට වඩා ලේසි වෙන්න තිබුණා....

මීට වඩා සතුටින් ඉන්නවා වෙන්න තිබුණා...

එතකොට දැන්,

පරක්කු වැඩි ද........!!

17. සුපුරුදු කැනාස් මල්

තාමත් වැව අද්දර පූදිනවා

ඉඳහිට මාළුවෙක් දෙන්නෙක් හොටේ පැටලී යනවා

නිසොල්මනේ මෙන් තාමත් වැවේ රළ නැගෙනවා

පවනේ මුසු වූ රස කතා හඬ දැස් තෙත් කරනවා

ඔබ නොමැති මුත් මෙතැන තවම මම හිඳිනවා…..

18. සිතුවිලි දහසක් මවනා හදවත

ගොලු වූවෙකු ලෙස පසුවන හේතුව

පන්හිඳ සිටියත් නොදන්නවා සේ

පන්හිඳ සෙලවුණු සෑම විටෙකවම

ඇත් වුණා මිස ළං වූවෙකු නැත....

19. දුටු මුල් දිනේ පටන්,

එක් දිනක හෝ සැබැවින් නොදැක

සේම කිසිදින හමුනොවී,

එදා මෙදා තුර

නොසිතූ තරමට

හදවතට ම බැදුණු

ආදරණීයයෙක් වුණා නම් ඒ ඔහු යි....

හැරී!!!

ඔව්.. Harry Potter ⚡

20. ලස්සනට සැරසිලා ඉන්නවා දෙපළක්

ඒ වගේ තවත් අය බොහෝ ගණනක්..

ගුරු දා උදෑසන එකම රඟ මඬලක්,

මංගල රූපෙට ලස්සන පොටෝ තොගයක්...

තේවාවේ හඬ ඇහෙනකොට

සිතේ සැනසීමක්...

රන් පාට සිවුරුපට හැඳ ඉන්න පිරිසක්..

පිඬුසිඟා වඩිනවා,

නැහැනෙ කිසි කලබලයක්

සිත් සතන් නිවනවා......

කහ පාට තැවරිච්ච එකම එක කඩුල්ලක්

ඉන් එක් පසක්,

සසර වෙත බැඳීමක්...

අනෙක් පස නම්,

සසර අත් හැරීමක්...

දෙපස පසු කරන

ජීවිත බොහෝ ගණනක්..

වෙනස වටහාගන්න බැරි එකම විපතක්.........



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩීම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාත෴

2023 10 20